**තංගල්ල නගර සභාව - 2023**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

තංගල්ල නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට තංගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයන් සඳහා ලද එක්වන් මුදල් රු.2,788,747 ක් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මිශ්‍ර තැන්පත් යටතේ ඇති එක්වන් මුදල් වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කළ බව | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | එකතු වටිනාකම රු.715,397 ක් වූ පාරිභෝජන ද්‍රව්‍ය තොගය ගිණුම්ගත කර නොතිබුණි. | ගබඩාවෙන් නිකුත් නොකල ඉතිරි වී ඇති පාරිභෝජන ද්‍රව්‍ය තොග වටිනාකම පමණක් අතැති තොග යටතේ පෙන්වා ඇති බව | තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | තංගල්ල බස් නැවතුම්පොළ කඩ කාමර 21 ක් සඳහා 2012 වර්ෂයේ සිට 2016 අප්‍රේල් මස දක්වා එකතුව රු.543,400 ක ලැබිය යුතු කඩකුලී බිල්කර නොතිබීම නිසා ආදායම එම වටිනාකමින්ම අඩුවෙන් දැක්වුණි. | 2012 වර්ෂයේ සිට 2016 අප්‍රේල් මාසය දක්වා කඩකුලී බිල් කිරීමක් සිදු කර නොමැති බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.379,468 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම මඟින් නිවැරදි කරන බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| | | - |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.30,605,855 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | සියලු වත්කම් තක්සේරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතින බවත්, තක්සේරු කරන ලද වටිනාකම් 2024 වර්ෂයේ ගිණුම් වල ගැලපීම් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 වගන්තිය | වරිපනම් දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අයකළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර 2013 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකිරීම නිසා තක්සේරුව කාලීනව ක්‍රියාත්මක නොවූ කාලය වර්ෂ 05 ක් විය. | වරිපනම් දේපල තක්සේරුව ප්‍රතිශෝධනය කර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | නගර සභා ආඥා පනතේ 74 හා 77 වගන්තිය | භූමියෙහි අයිතිය සභාව වෙත නීත්‍යානුකූලව ලබාදී තිබූ වෙළඳ පරිශ්‍රයන් තුළ අනවසරයෙන් ස්ථිර කඩ කාමර ඉදිකර කුලී මුදල්ද නොගෙවා වෙළඳාම් කටයුතු සිදු කරනු ලැබූ කඩ කාමර 13 ක් සම්බන්ධයෙන් පනතේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | මෙම කඩ කාමර සම්බන්ධයෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 28,954,795 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,775,520 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,880,500 | 8,125,611 | 9,836,885 | 2,721,646 | 7,050,000 | 7,439,833 | 7,136,825 | 4,432,920 |
| කුලී | 19,647,200 | 19,778,392 | 20,392,721 | 12,221,362 | 17,734,900 | 17,262,075 | 20,314,140 | 12,835,691 |
| බලපත්‍ර ගාස්තු | 799,500 | 1,053,388 | 927,388 | 353,000 | 743,000 | 1,032,979 | 950,979 | 227,000 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| වෙනත් ආදායම් | 14,724,400 | 21,636,030 | 19,818,708 | 3,411,940 | 10,649,400 | 11,891,390 | 14,544,763 | 1,594,618 |
| | ---------- | ----------- | ---------- | ----------- | ------------- | ----------- | ----------- | ----------- |
| **එකතුව** | 42,051,600 | 50,593,421 | 50,975,702 | 18,707,948 | 36,177,300 | 37,626,277 | 42,946,707 | 19,090,229 |
| | ====== | ====== | ====== | ====== | ======= | ====== | ====== | ====== |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඒකක 1564 කින් ලැබිය යුතු වරිපනම් බදු රු.2,234,701 ක් හා කඩකාමර 106 කින් ලැබිය යුතු කඩකුලි රු.7,396,737 ක් අයකර ගැනීමට නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර හිඟහිටි වරිපනම් බදු ශේෂය තුළ වර්ෂ 02 ත් 03 ත් අතර සහ වර්ෂ 03 ට වැඩි ශේෂය පිළිවෙලින් රු.284,930 ක් හා රු.453,020 ක් විය. | වරිපනම් බදු හා කඩ කුලී පිළිවෙළින් රු.261,389 ක් හා රු.5,153,429 ක් අය කර ගත් බවත්, රු.5,000 ට වැඩි වරිපනම් ඒකක 94 කට රතු නිවේදන නිකුත් කල බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) | ව්‍යාපාර ඒකක 140 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු රු.392,240 ක් හා කර්මාන්ත ඒකක 15 කින් ලැබිය යුතු කර්මාන්ත බදු රු.22,000 ක් 2022 දෙසැම්බර් 23 දිනැති අංක 2312 දරණ ගැසට් නිවේදනය පරිදි 2023 මාර්තු 31 දිනට ප්‍රථමව අයකළ යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි. | ව්‍යාපාර බදු සහ කර්මාන්ත බදු හිඟයෙන් රු. 90,400 ක් අය කර ගත් බවත්, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | අංක S-24 දරණ කඩ කාමරය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ ඉදිරිපත් කර තිබූ තක්සේරු වාර්තාවෙහි සඳහන් රු.15,750 ක තක්සේරු කුලිය අයකිරීම මාසික මහා සභාව විසින් පිළිනොගැනීම සහ 2022 තක්සේරු වාර්තාවේ සඳහන් රු.16,500 ක මාසික තක්සේරු කුලිය අයකිරීම මාසික මහා සභාව පිළිගෙන තිබුණද, නව තක්සේරු මුදලට ගිවිසුම්ගත වීමට සභාව කටයුතු නොකිරීම මත සමාලෝචිත වර්ෂයේ අවසානයට සභා අරමුදලට සිදුවූ පාඩුව රු.1,115,000 ක් විය. | මෙම කඩ කාමරය සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා ඇති බවත්, දෙනු ලබන උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කරන බව. | තක්සේරු කුලිය අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාව සතු අංක - 32 දරණ කඩ කාමරය 1994 මැයි මස 19 දින සිට බදුගත් බදුකරු විසින් බදුකුලී ගෙවීම පැහැර හරිමින් කඩ කාමරය පිහිටි ස්ථානයේ අනවසරයෙන් දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ආපනශාලාවක් පවත්වා ගෙන යනු ලැබුවද, ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් සභා කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. | කඩකාමරය පිහිටි භූමිය තංගල්ල ප්‍රාදේශීය ලේකම් සතු බවත්, ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව තීරණය කිරීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත යොමු කළ බව. | අනවසර කඩකාමරය සභා සන්තකයට පවරා ගැනීමට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | නගර සභාවේ සහිකයෙකු ලෙස 2008 වර්ෂයේ සිට 2023 වර්ෂයේ මාර්තු 18 දක්වා කටයුතු කළ පුද්ගලයෙකු විසින් සභාවට අයත් බස් නැවතුම්පොළ අංක S-01 දරණ කඩ කාමරයේ බදුකරු වශයෙන් පෙනීසිටීම නගර සභා ආඥා පනතේ 227(1) වගන්තියට අනුකූල නොවන බවත්, එම කාල සීමාව වෙනුවෙන් ඔහුට ගෙවන ලද එකතුව රු.1,864,000 ක් වූ දීමනාවල වටිනාකම සහ එම කඩ කාමර වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් ලැබිය යුතු කඩකුලී රු.946,011 ක් හා රු.43,000 ක දඩ මුදල් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | මෙම කඩ කාමරය සම්බන්ධයෙන් වාස බද්ද අවසන් කිරීම සඳහා 2023 ඔක්තෝබර් 10 දින දැන්වීම් පල කර ඇති බවත්, ඊට අදාල නඩු වාරය 2024 මැයි 10 දින නැවත කැඳවීමට නියමිත බැවින් ඒ අනුව කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඊ) | සභාවේ ලේකම් අමතන ලද දකුණු පළාත් නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්ගේ 2021 අප්‍රේල් 23 දිනැති අංක 4/03/09 දරන ලිපියේ ii ඡේදය මඟින් S-1 කඩ කාමරය පවරා ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හෝ 1979 අංක 07 දරන රජයේ ඉඩම්වල සහතිකය ආපසු ලබාගැනීමේ පනත අනුව කටයුතු කිරීම සුදුසු බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මෙම කඩ කාමරය සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් සහා කළමනාකාරිත්වය ගෙන නොතිබුණි. | මෙම කඩ කාමරය සම්බන්ධයෙන් වාස බද්ද අවසන් කිරීම සඳහා 2023 ඔක්තෝබර් 10 දින දැන්වීම් පල කර ඇති බවත්, ඊට අදාල නඩු වාරය 2024 මැයි 10 දින නැවත කැඳවීමට නියමිත බැවින් ඒ අනුව කටයුතු කරන බව. | කඩ කාමරය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | සභාව සතු තානායම බදු දීමෙන් ලැබිය යුතු රු.4,349,253 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර හිඟ හිටි ශේෂය තුළ වර්ෂ 02 ට වැඩි ශේෂය රු.790,406 ක් විය. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඌ) | ලැබිය යුතු දැන්වීම් පුවරු ඒකක 268 ක ගාස්තු රු.268,000 ක් , ව්‍යාපාර ඒකක 85 ක වෙළඳ බලපත්‍ර ගාස්තු රු.85,000 ක් හා ස්ථිර දැන්වීම් පුවරු ඒකක 04 ක ගාස්තු රු.1,010,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැන්වීම් පුවරු ගාස්තු හා වෙළඳ බලපත්‍ර ගාස්තු පිළිවෙළින් රු.14,000 ක් හා රු.3000ක් අයකර ගත් බවත් ස්ථිර දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට රු.500 මිල අධික බවට කරන ලද ඉල්ලීම් මත රු.150 බැගින් ගාස්තු සංශෝධනයට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (එ) | 2022 දෙසැම්බර් 23 දිනැති අංක 2312 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව දීපව්‍යාප්ත හෝ අන්තර්ජාතික සමාගම් හෝ ආයතන මඟින් ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර දැන්වීම් පුවරුවකට අදාළව සේවා ගාස්තු ලෙස වර්ග අඩියකට රු.500 ක් බැගින් අයකළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර දැන්වීම් පුවරුවකට වර්ෂයකට රු.1,000 බැගින් බිල්කර තිබීම නිසා දැන්වීම් පුවරු 13 ක් වෙනුවෙන් සභාවට අහිමි වූ ආදායම රු.1,000,500 ක් විය. | අතුරු ව්‍යවස්ථාවට අනුව ස්ථිර දැන්වීම් පුවරු වලින් අය කිරීමට හැකියාව පවතිනුයේ රු.1,000 ක බලපත්‍ර ගාස්තුවක් පමණක් බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | සභාවට අයත් ගිනි හා ආපදා ඒකකයෙන් සහ ගිලන් රථයෙන් ලැබිය යුතු එකතුව රු.654,825 ක් වූ ආදායම් අයකර ගැනීමට නගර සභා ආඥා පනතේ 170අ(1) හා (2) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඔ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.15,636,568 ක් විය. | රු.4,399,979 ක් අයකර ගත් බවත්, ඉතිරි හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 23 දිනැති අංක 2312 දරන ගැසට් පත්‍රයට අනුව බල ප්‍රදේශයේ පමණක් ස්ථාපිත ස්ථාවර දැන්වීම් පුවරුවක් වෙනුවෙන් වර්ග අඩියකට රු.75 ක් බැගින් අයකළ හැකි වුවත්, එම ගාස්තුව රු.1,000 ක උපරිමයකට සීමාකර තිබීම නිසා සභාවට උපයාගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණි. | සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාව අනුව ස්ථාවර දැන්වීම් පුවරු සඳහා අයකළ හැකි ගාස්තුව වන්නේ රු.2.50 ක් බවත්, පසුව සභිකයින්ගේ අභිමතය පරිදි දැන්වීම් පුවරු ගාස්තු තීරණය කර ඇති බව. | ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

### 3.2 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ වාර්ෂික අයවැය ලේඛනය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කර ගෙන තිබූ එකතු වටිනාකම රු.2,500,000 ක් වූ සංවර්ධන යෝජනා 05 ක් ක්‍රියාත්මක නොකර සභාවේ ආදායම් බැංකුගත කිරීමට සභා කළමණාකාරීත්වය කටයුතු කිරීම නගර සභා ආඥා පනත මගින් සභාව වෙත පැවරී තිබූ කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීමක් නොවිය. | සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදල ප්‍රමාණවත් නොවීම, අධික වර්ෂාපතනය සහ වර්තමානය වන විට ඇතැම් ව්‍යාපෘති අත්‍යවශ්‍ය නොවීම හේතු වූ බව. | අයවැය මඟින් ප්‍රතිපාදන වෙන්කර තිබූ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාව විසින් භුක්ති විඳිනු ලබන ඉඩම් හා ගොඩනැගිලි 21 ක නීත්‍යානුකූල අයිතිය සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට අදාල කටයුතු සිදුකරමින් පවතින බව. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතු වටිනාකම රු.671,400 ක් වූ මිලදීගැනීම් සම්බන්ධයෙන් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදනය කිරීමට ඇති භාණ්ඩ හෝ සේවා සඳහා මිල ගණන් ලබා ගන්නා විට පුළුල් විස්තර වලින් සමන්විත පිරිවිතර වලින් යුත් මිල ගණන් ලබා ගන්නා බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු කම්පැක්ටර් රථය සඳහා එකතු වටිනාකම රු.324,000 ක් වූ ටයර් 04 ක් මිලදීගැනීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ මිල කැඳවීම් ලිපියේ ඇතුළත් වගකීම් කාලය, වර්ගය, පොටගණන, නිෂ්පාදිත රට සහ මිල යන පිරිවිතර අයිතමයන් අතුරින් මිල හා වර්ගය පමණක් සැලකිල්ලට ගෙන තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මිලදීගැනීමට සුදුසු ආයතනය නම්කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 (අ) (II) වගන්තියට අනුකූල නොවුණි. | ඉදිරියේදී පවත්වනු ලබන තාක්ෂණික ඇගයීම් කමිටුවේදී මේ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 වගන්තියේ සඳහන් විධිවිධාන වලින් බැහැරව සිසු නිපුණතා වැඩසටහන සඳහා ත්‍යාග ලබාදීමට හදිසි ප්‍රසම්පාදනයක් ලෙස සලකා එකතුව රු.140,270 ක් වූ පිටු 120 CR පොත් 830 ක් මිලදීගෙන තිබුණි. | පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිඛිත උපදෙස් පරිදි කටයුතු කර ඇති බවත්, ඒ සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) වගන්තියට අනුව යම් සාමාජිකයෙකු ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව යන කමිටු දෙකේම සාමාජිකයෙකු නොවිය යුතු වුවත්, එපරිදි කටයුතු නොකර එකතු වටිනාකම | ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව යන කමිටු දෙකේම එකම සාමාජිකයෙකු පත් නොකිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

රු.902,200 ක් වූ මිලදී ගැනීම් තුනකට අදාළව පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයකු ප්‍රසම්පාදන කමිටුවේද සාමාජිකයෙකු ලෙස කටයුතු කර තිබුණි.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් නිශ්චිත ප්‍රදාන - 2023 යටතේ සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත 04 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.2,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර, එම කර්මාන්ත ඇස්තමේන්තු කළ පරිදි ක්‍රියාත්මක කර නොතිබීම සහ නිවැරදිව ඇස්තමේන්තු සැකසීමට කටයුතු නොකිරීම මත රු.569,794 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | ඉදිරියේදී මුදල් ඉතිරිවීම් සිදු නොවන ආකාරයට ඇස්තමේන්තු කටයුතු සිදු කරන බව. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීමටත්, ඇස්තමේන්තු කළ පරිදි කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් සකස් කර ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 03 කට අදාළව වෙරගැන්වීම් සඳහා කම්බි යොදා ඇති ආකාරය දැක්වෙන ලේඛනයක් (bar bending schedule) සකස් කර ඉදිරිපත් නොකර වෙරගැන්වීම් සඳහා රු.442,725 ක් ගෙවීම් කර තිබුණි. | මෙම අතපසු වීම ඉදිරි ඇස්තමේන්තු සඳහා ගෙවීම් කටයුතු සිදු කිරීමේදී සිදු නොවීමට වගකීමෙන් කටයුතු කරන බව. | වෙර ගැන්වීම් සඳහා කම්බි යොදා ඇති ආකාරය දැක්වෙන ලේඛනය ඉදිරිපත්කර නොතිබියදී කම්බි සඳහා ගෙවීම් නොකල යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 147 ක් සහ 144 ක් වූයෙන් තනතුරු 07 කට අදාළ අතිරික්තතා 26 ක් සම්පූර්ණ කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | අතිරික්ත සංවර්ධන නිලධාරීන් අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් කිරීමට කටයුතු කරන බවත්, පුරප්පාඩු තනතුරුවල රාජකාරි අතිරික්ත තනතුරුවලින් ආවරණ කර ගන්නා බව. | කාර්ය මණ්ඩලයේ අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වර්ෂයට හිමි නිවාඩු දින 45 ඉක්මවා සභාවේ සේවකයන් 17 දෙනෙකු 2022 වර්ෂයේදී නිවාඩු දින 701.5 ක් සහ 2023 වර්ෂයේදී සේවකයන් 25 දෙනෙකු නිවාඩු දින 1142 ක් ලබාගෙන තිබීමෙන් සභාවේ දෛනික වැඩකටයුතු කරගෙන යාමට බාධාවක් වීම තුළ එම තත්ත්වයන් පාලනය කිරීමට සභා කළමනාකාරීත්වයේ අවධානය යොමු වී නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන් නිරන්තරයෙන් සෞඛ්‍ය ගැටළු වලට මුහුණ දීම, නොදන්වා සේවයට නොපැමිණීම හා සේවකයෙක් පළාත් සභා ඡන්ද අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීම හේතුවෙන් නිවාඩු ලබාගැනීම යන කරුණු හේතු වූ බව. | වැටුප් රහිත නිවාඩු ලබා දීම කළමනාකරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2012 හා 2016 වර්ෂයන් වලදී මිය ගොස් තිබූ සේවකයන් දෙදෙනෙකුගෙන් ලැබිය යුතු රු.5,000 ක උත්සව අත්තිකාරම් හා රු.46,135 ක ආපදා ණය අයකර ගැනීම සඳහා කළමනාකාරීත්වය විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රු.15,010 ක ණය ශේෂය අයකර ගැනිමට ඇපකරුවන් නොමැති අතර රු.36,125 ක සේවක ණය අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමුකළ ඇති බව. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.7 දූෂ්‍ය අක්‍රමිකතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාවේ දින මුද්‍රාව හා ලිපි ශීර්ෂ භාවිතා කර ගොඩනැගිලි සැලැස්මක් හා අනුකූලතා සහතිකයක් කූට ලෙස සකස් කර බාහිර පුද්ගලයෙකුට ලබාදී තිබූ අතර මෙම කූටලේඛන සභාවේ කාර්මික නිලධාරියෙකු සම්බන්ධ වී සකස් කර අදාළ පුද්ගලයාට ලබාදී තිබූ අතර මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම සිදු වීමට අදාළ මූලික විමර්ශනය මේ වන විට සිදු කෙරෙමින් පවතින බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |